# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ප්‍රාදේශීය සභා (සංශෝධන)

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් 2018 අප්‍රේල් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ඔක්තෝබර් මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[241 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ වතු ජනාවාසවල සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රාදේශීය සභා අරමුදලෙන් යම් කොටසක් වැය කිරීමට ප්‍රාදේශීය සභාවලට බලය ලබා දීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසුව සහ අදාළ වත්තෙහි පාලනාධිකාරියේ එකඟත්වය ඇතිව වැවිලි ප්‍රදේශවල පාරවල් සහ වෙනත් පොදු පහසුකම් ඉදිකිරීමට සහ පවත්වාගෙන යාමට ප්‍රාදේශීය සභාවලට බලය ලබා දීම වේ.

## ප්‍රාදේශීය සභා (සංශෝධන)

එල්.ඩී.—ඕ. 3/2016.

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2017 අංක     දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1987 අංක 15 දරන පනතේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (xiv) වන ඡේදයේ ''ගම්වල වැඩ ඉදිකිරීම හෝ වෙනස් කිරීම,'' යන වචන වෙනුවට ''ගම්වල හෝ වතු ජනාවාසවල වැඩ ඉදිකිරීම හෝ වෙනස් කිරීම,'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) (xxii) වන ඡේදයේ ''තෝරාගත් ගම්වල ඒකාබද්ධ සංවර්ධන'' යන වචන වෙනුවට ''තෝරාගත් ගම්වල, වතු ජනාවාසවල ඒකාබද්ධ සංවර්ධන'' යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

''(2) වැවිලි ප්‍රදේශ සම්බන්ධයෙන් වන විට, ප්‍රාදේශීය සභාව විසින්, විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසුව සහ අදාළ වත්තෙහි පාලනාධිකාරියේ එකඟත්වය ඇතිව, අදාළ වැවිලි ප්‍රදේශවල පදිංචිකරුවන්ට අවශ්‍ය පාරවල්, ළිං සහ එම පදිංචිකරුවන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය වන වෙනත් පොදු පහසුකම් ලබා දීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදල උපයෝගී කරගනු ලැබිය හැකි ය.

මේ වගන්තියේ කාර්යය සඳහා ''වැවිලි ප්‍රදේශ'' යන්නෙන් මධ්‍යම, ඌව, සබරගමුව, දකුණ, බස්නාහිර සහ උතුරු මැද පළාත් තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතේ පවතින, නේවාසික කම්කරුවන් වාසය කරන තේ, රබර්, පොල් සහ ඔයිල් පාම් වගා කරනු ලබන වතු පිහිටා ඇති ප්‍රදේශ අදහස් වේ.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.